සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

10 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | 11 S I

නම: ..............................................

# බුද්ධ ධර්මය

කාලය පැය එකයි

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01. සිදුහත් බෝසතාණන් වහන්සේ දේවාරාධනය ලැබීමෙන් පසු තම අවසන් උපත සඳහා සුදුසු පසුබිම නුවණින් විමසා බැලීම හඳුන්වනුයේ,
    1. සමතිස් පෙරුම් පිරීම නමිනි
    2. පංචමහා ස්වප්න දැකීම නමිනි.
    3. පංච මහා විලෝකන නමිනි
    4. චතුරංග සමන්නාගත වීර්යය නමිනි.

02. "ආරභථ නික්ඛමථ - යුඤ්ජථ බුද්ධ සාසනේ" යන ගාථාව සඳහන් වන සූත්‍රය වන්නේ,
    1. අරුණවතී සූත්‍රය
    2. කාලාම සූත්‍රය
    3. දම්සක් පැවතුම් සූත්‍රය
    4. මහා සීහනාද සූත්‍රය

03. නිවන් පසක් කිරීමට අවශ්‍ය මනා වූ පිළිවෙත් රකිනා බැවින් මහා සංඝ රත්නය,
    1. උජුපටිපන්න නම් වේ.
    2. ආහුනෙය්‍ය නම් වේ.
    3. පාහුනෙය්‍ය නම් වේ.
    4. සුපටිපන්න නම් වේ.

04. "ගෞතමයන් වහන්ස, ඇතුළත අවුල් ය. පිටත අවුල් ය. සත්ව ප්‍රජාව අවුලෙන් වෙළී සිටී. කවරෙක් නම් මෙම අවුල් නිරවුල් කරන්නේද?" යන ප්‍රශ්නයට දුන් පිළිතුරෙහි ඇතුළත් ගැටලු විසඳීමේ ක්‍රමය වන්නේ,
    1. ත්‍රි ලක්ෂණය වැඩීමයි.
    2. ත්‍රි ශික්ෂා වැඩීමයි.
    3. ත්‍රි විද්‍යා වැඩීමයි.
    4. ත්‍රි වේදය වැඩීමයි.

05. හිඳීම, සිටීම, ඇවිදීම ආදී සියලු ක්‍රියාවන්හි අවබෝධයෙන් යුතුව සිටීම හඳුන්වන්නේ,
    1. ඉන්ද්‍රිය සංවර නමිනි
    2. සන්තුට්ඨිතා නමිනි
    3. සති සම්පජඤ්ඤ නමිනි
    4. සුභරෝ නමිනි

06. සැරියුත් මහා රහතන් වහන්සේ බුදු සසුනේ පැවිදි වීමට පෙර පැවිදිව සිටියේ,
    1. සංජය පිරිවැජියා සමීපයේ
    2. උපක ආජීවක සමීපයේ
    3. කෝලිත පිරිවැජියා සමීපයේ
    4. පොට්ඨපාද පිරිවැජියා සමීපයේ

07. "උඩගු නොව මහණ" යන වචන තුන ලියා පිවිසුම් දොරටුවේ අලවා තබා ගත්තේ,
    1. මිහිඳු මහරහතන් වහන්සේ
    2. මහා කාශ්‍යප හිමි
    3. වැලිවිට සරණංකර හිමි
    4. සැරියුත් හිමි

08. යම් බීජයක් වපුරා ද ඒ අනුව ඵල ලැබේ. මෙම අදහස ඇතුළත් ධම්මපද ගාථාවේ මුල් දෙපදය වන්නේ,
    1. සුසුඛං වත ජීවාම - වේරිනේසු අවේරිනො,
    2. යදිසං වපතෙ බීජං - තාදිසං හරතේ ඵලං
    3. යථාපිමූලේ අනුපද්දවේ දළ්හේ - ජින්නොපි රුක්ඛො පුනරේව රුහති
    4. ආරෝග්‍යා පරමා ලාභා - සන්තුට්ඨී පරමං ධනං

09. කරුණු නොදැන පදනමකින් තොරව ඇතිකරගත් ශ්‍රද්ධාව, ධර්මයේ හඳුන්වනු ලබන්නේ,
    1. අකාරවතී ශ්‍රද්ධාව
    2. ශ්‍රද්ධාව
    3. අවෙච්ඡපසාදය
    4. අමූලිකා ශ්‍රද්ධාව

10. පංච නීවරණ ධර්ම අතරට අයත් "සිතේ නොසන්සුන්කම හා කළ නොකළ දේ පිළිබඳ සිතෙහි ඇතිවන පසුතැවිල්ල" හඳුන්වනු ලබන්නේ,
    1. උද්ධච්ච කුක්කුච්ඡ නමිනි
    2. ථීන මිද්ධ නමිනි
    3. ව්‍යාපාද නමිනි
    4. කාමච්ඡන්ද නමිනි

11. ජනක කර්මයට බාධා පමුණුවන, එහි බලය හීන කරවන කර්මය වන්නේ,
    1. කටත්තා කර්ම ය
    2. උපපීඩක කර්ම ය
    3. උපත්ථම්භක කර්ම ය
    4. උපඝාතක කර්ම ය

12. තිදොරින් සිදු කරන අකුසල් කර්ම අතර කාය කර්ම ගණයට අයත් නොවන කරුණ වන්නේ,
    1. ප්‍රාණඝාතය
    2. අදත්තාදානය
    3. කාමමිථ්‍යාචාරය
    4. අභිද්‍යාව

13. බුදුරජාණන් වහන්සේ සිංසපා සූත්‍රය දේශනා කළ ස්ථානය වන්නේ,
1. ඇට්ටේරියා වනයේ දී 2. කුඹුරක දී 3. ජීවක අඹ උයනේ දී 4. අචිරවතී නදී තීරයේ දී

14. යම් සේ ගසක මුල ශක්තිමත්ව නොගැලවී පවතින්නේ ද ඒතාක් කල් එම ගස නැවත නැවත ලියලන්නා සේ පුද්ගලයා ද නැවත නැවත සසර දුකට පත්වන්නේ ,
1. වෛරය හේතු කරගෙන ය 2. මානය හේතු කොට ගෙන ය
3. තණ්හාව හේතු කොට ගෙන ය 4. කාමය මුල් කරගෙන ය

15. බුදු දහමේ සඳහන් මූලික ඉගැන්වීමක් වන සිව්සස් සඳහන් සූත්‍ර දේශනාව වන්නේ,
1. චක්කවත්ති සීහනාද සූත්‍රය 2. චූල්ලහත්ථි පදෝපම සූත්‍රය
3. මහා පරිණිබ්බාණ සූත්‍රය 4. දම්සක් පැවතුම් සූත්‍රය

16. බුදුරජාණන් වහන්සේගේ වර්ණනාවට භාජනය වූ උදේන, ගෝතමක, සත්තම්භක, සාරන්දද ආදී රමණීය චෛත්‍ය පිහිටි ස්ථානය වනුයේ,
1. රජගහ නුවර 2. විශාලා මහනුවර 3. කිඹුල්වත් නුවර 4. උදේනි නුවර

17. සුදත්ත හෙවත් අනේපිඬු සිටුතුමා මුලින්ම බුදුරජාණන් වහන්සේ මුණගැසුණේ බුදුන් වහන්සේ කිනම් ස්ථානයක වැඩ සිටියදී ද යැයි නිවැරදි පිළිතුර වනුයේ,
1. වේළුවනාරාම ය 2. විශාලා මහනුවර කූටාගාර ශාලාවේ දී
3. රජගහනුවර සීත වනයේ දී 4. ජේතවනාරාමයේ දී

18. පටිච්ච සමුප්පාද න්‍යායට අනුව ''හේතුං පටිච්ච සම්භූතං හේතුභංගා නිරුජ්ඣති'' යන්නෙන් අදහස් කරන ලද්දේ,
1. හේතු නැතිවන විට ඒ හේතු නිසා හටගත් ඵලය ද නැතිව යන බව යි.
2. ඕනෑම දෙයක් ඇතිවීමට කිසියම් හේතුවක් බලපාන බව යි.
3. හේතු සොයා බලා ඒවාට ප්‍රතිකර්ම කළ යුතු බව යි.
4. හේතුවක් කරණකොට සියල්ල විනාශ වන බව යි.

19. අකුසලය ද අකුසල් මූලය ද, කුසලය ද කුසල මූලය ද, අකුසලය ද අකුසල් විපාකය ද, කුසල ද කුසල විපාක ද, දැන දැක ගන්නා අරි අටඟ මඟෙහි අංගය වන්නේ,
1. සම්මා කම්මන්ත 2. සම්මා ආජීව 3. සම්මා සංකප්ප 4. සම්මා දිට්ඨි

20. සිඟාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි භාර්යාවගෙන් ස්වාමි පුරුෂයාට ඉටුවිය යුතු යුතුකම් අතරට අයත් නොවන කරුණ වන්නේ,
1. ගේ දොර කටයුතු මැනවින් සංවිධානය කිරීම 2. ඇඳුම් පැළඳුම් සපයා දීම
3. උපයන ලද ධනය ආරක්ෂා කිරීම 4. පිරිවර ජනයාට සංග්‍රහ කිරීම

21. බුද්ධා දී අටතැන්හි සැක කිරීම ධර්මයේ හැඳින්වෙන්නේ,
1. කාමච්ඡන්ද 2. ථීන මිද්ධ 3. විචිකිච්ඡාව 4. උද්ධච්ච කුක්කුච්ච

22. සංසාරය නැමති සාගරය තරණය කිරීමට ඉවහල් වන, එසේම වැපිරිය යුතු බීජයක් ලෙස දක්වා ඇති, නිවන් මගට පිවිසීමට මුල්වන ධර්ම කරුණ වන්නේ,
1. භක්තිය 2. සද්ධාව 3. ඔත්තප්ප 4. තපස

23. බුදුරජාණන් වහන්සේ ලෝවැඩ සඟරාවේ "සත්හට වන බව දුකට වෙදාණන් "ලෙස සඳහන් කර ඇත්තේ,
1. සත්වයගේ කායික ලෙඩ දුක්වලට උතුම් වෛද්‍යවරයකු වූ නිසා
2. උසස් ශල්‍ය වෛද්‍යවරයකු වන නිසා
3. සත්වයාට වන ඕනෑම ලෙඩ දුක්වලට ප්‍රතිකාර කළ උතුම් වෛද්‍යවරයකු නිසා
4. සසර දුකට ප්‍රතිකාර කරන උතුම් වෛද්‍යවරයකු නිසා

24. බුදුරජාණන් වහන්සේ විසින් රෝග වැළඳීමට හේතු අටක් දේශනා කළේ කිනම් භික්ෂූන් වහන්සේ අරභයාද?
1. ගිරිමානන්ද හිමි 2. ආනන්ද හිමි 2. මහා කාශ්‍යප හිමි 4. මුගලන් හිමි

25. බුදුරජානන් වහන්සේ පමණ දැනගෙන ආහාර ගැනීමේ වැදගත්කම පිළිබඳ කොසොල් රජුට දේශනා කළ සූත්‍ර දේශනාව වන්නේ,
1. සිඟාලෝවාද සූත්‍රය 2. ගිරිමානන්ද සූත්‍රය
3. දෝණපාක සූත්‍රය 4. ධීතු සූත්‍රය



සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

26. නැගිට ගැනීමට බැරි තරමට කෑම ගෙන එහිම පෙරළී සිටින තැනැත්තා හඳුන්වනු ලබන්නේ,
   1. ආහාර හත්ථක නමිනි
   2. තත්ථාවට්ටක නමිනි
   3. භුත්තවමිතක නමිනි
   4. අලංසාටක නමිනි

27. බුද්ධ පරිණිර්වාණයෙන් පසු පස්වන හා හයවන ධර්ම සංගායනා පවත්වා ඇති ස්ථානය වන්නේ,
   1. තායිලන්තයේ
   2. ශ්‍රී ලංකාවේ
   3. ඉන්දියාවේ
   4. මියන්මාරයේ (බුරුමය)

28. විභාෂා නමින් අටුවා ග්‍රන්ථ සම්පාදනය කොට තඹ පත්තිරුවල ලියවා, සෙල්මුවා මංජුසාවල බහා ස්තූපයක තැන්පත් කරන ලද්දේ,
   1. කණිෂ්ක සංගායනාවේ දී
   2. තෙවන ධර්ම සංගායනාවේ දී
   3. අලුවිහාර සංගායනාවේ දී
   4. දෙවන ධර්ම සංගායනාවේ දී

29. පාලි ත්‍රිපිටකය ඉංග්‍රීසියට පරිවර්තනය කර බෙදා හැරීමට එංගලන්තයේ පාලි ග්‍රන්ථ සමාගම පිහිටුවන ලද්දේ,
   1. හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා
   2. අනගාරික ධර්මපාලතුමා
   3. සෙනරත් පරණවිතාන මහතා
   4. රිස් ඩේවිඩ් පඬිතුමා

30. දස සක්විතිවත් සඳහන් වන සූත්‍ර දේශනාව වන්නේ,
   1. මහා පරිණිබ්බාණ සූත්‍ර ය
   2. චක්කවත්ති සීහනාද සූත්‍ර ය
   3. අනත්ත ලක්ඛණ සූත්‍ර ය
   4. සිඟාලෝවාද සූත්‍ර ය

31. අන් අයගේ දියුණුව හා යහපත පිණිස කටයුතු කිරීම බුදු දහමේ හඳුන්වනු ලබන්නේ,
   1. පරාර්ථචර්යාව නමිනි
   2. අර්ථචරියාව නමිනි
   3. දානය නමිනි
   4. මුදිතා නමිනි

32. සෙනරත් පරණවිතාන මහතාට අනුව චතුරස්‍රාකාර ස්ථූපයක් ලෙස නම්කර ඇති ස්ථූපය වන්නේ,
   1. පොළොන්නරුවේ සත්මහල් ප්‍රාසාදය
   2. කතරගම කිරිවෙහෙර
   3. කැළණි දාගැබ
   4. දෑදිගම කොටවෙහෙර

33. විද්වතුන්ගේ සම්භාවනාවට ලක් වූ කලාත්මක මුරගල පිහිටි ස්ථානය වන්නේ,
   1. ලංකාරාමයේ
   2. මිහින්තලයේ කණ්ඨක චෛත්‍යයේ
   3. අභයගිරියේ රත්නප්‍රාසාදයේ
   4. අනුරාධපුරයේ ථූපාරාමයේ

34. ඉන්දියාවේ පැරණි අජන්තා සිතුවම් වලට නෑකම් කියන සිතුවම් මෙරට දැකිය හැකි ස්ථානය වන්නේ,
   1. හිඳගල චිත්‍ර
   2. සීගිරි චිත්‍ර
   3. තිවංක පිළිමගෙයි සිතුවම්
   4. මැදවල විහාරයේ චිත්‍ර

35. පොළොන්නරු යුගයේ රචිත මුවදෙව්දාවත කාව්‍ය ග්‍රන්ථය රචනා වීමට පාදක වූ ජාතක කතාව වන්නේ,
   1. සත්තුභත්ත ජාතක ය
   2. සස ජාතක ය
   3. කුස ජාතක ය
   4. මඛාදේව ජාතක ය

36. කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාලයේ පරිහානියට පත් බුද්ධ සසුන නගා සිටුවීමට උපාලි හිමි ප්‍රමුඛ දූත පිරිස උපසම්පදාව ගෙන ඒමට වැඩම කළ රට වන්නේ ,
   1. සියමට (තායිලන්තය)
   2. බුරුමයට (මියන්මාරයට)
   3. චීනයට
   4. ජපානයට

37. සිඟාලෝවාද සූත්‍රයට අනුව දෙමාපියන් හඳුන්වන නාමයක් නොවන්නේ,
   1. බ්‍රහ්ම
   2. පුබ්බාචරිය
   3. පුබ්බදේව
   4. ඊශ්වර

38. බුදුරජාණන් වහන්සේගේ දකුණු අකු ධාතුව තැන්පත් කර දේවානම්පියතිස්ස රජු ගොඩනැගූ ස්ථූපය වන්නේ,
   1. ථූපාරාමය
   2. මහියංගණය
   3. ගිරිහඬු සෑය
   4. රන්කොත් වෙහෙර

39. පරලොවක් නැත යන පිළිගැනීම මත මෙලොව වශයෙන් හැකිතාක් සැප විඳීමට ඇති ආශාව,
   1. කාම තණ්හාව
   2. භව තණ්හාව
   3. විභව තණ්හාව
   4. රස තණ්හාව

40. රාජ්‍ය පාලකයකු යුක්තිය - අයුක්තිය හොඳ නරක තෝරා ගැනීමට නොහැකිව මුලා වී අගතිගාමී වීම හඳුන්වන්නේ,
   1. ඡන්දය
   2. භය
   3. මෝහය
   4. ද්වේශය

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

10 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | 11 S II

නම: .............................................. **බුද්ධ ධර්මය**

පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4 ක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
පළමුවැනි ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

01. i. සිදුහත් කුමරුට ශිල්ප ඉගැන්වූ බමුණු පඬිවරයා නම් කරන්න.
 ii. බුද්ධ වචනයට අනුව රෝග දෙයාකාරය. ඒ මොනවාද?
 iii. තමා විසින් ම පිළිපැද ඇස් පනාපිට මෙලොව දීම ප්‍රතිඵල දැකගත හැකි ධර්මරත්නයේ ගුණය කුමක්දැයි නම් කරන්න.
 iv. "යේ ධම්මා හේතුප්පභවා - තේසං හේතුං තථාගතෝ ආහ" යන පාඨයේ අදහස ලියන්න.
 v. කර්මස්ථාන ලබා දීමේ දී සැලකිල්ලට ලක් කරන පුද්ගල චරිත අතරින් දෙකක් නම් කරන්න.
 vi. "සුසුඛං වත ජීවාම - වේරිනේසු අවේරිනෝ" මෙම පාඨයේ අදහස් ලියන්න.
 vii. තුන්තරා බෝධිය නම් කරන්න.
 viii. අවෙච්චප්පසාදය යනු කුමක්දැයි කෙටියෙන් ලියන්න.
 ix. සතර අගතිය නම් කරන්න.
 x. "ඇත ධූලින් වැසී ගිය ඇත් රජ යැ. මැන සවණක් ඝණ බුදුරැසින් සෑදී ගිය බුදුරජාණෝ යැ..."යන පාඨය ඇතුළත් ධර්ම ග්‍රන්ථය හා කතුවරයා නම් කරන්න.

02. i. "චේතනාහං භික්ඛවේ කම්මං වදාමි" යන පාඨයේ අදහස ලියන්න.
 ii. විපාක දෙන ආකාරය අනුව කර්මය බෙදා දක්වන ආකාර හතර දක්වන්න.
 iii. කර්මය හා කර්ම ඵලය පිළිබඳ අවබෝධය පුද්ගලයා හා සමාජ යහපතය සඳහා ඉවහල් වන ආකාරය පෙන්වා දෙන්න.

03. i. පුද්ගලයාගේ කීර්තිය (යසස) වැඩීමට ඉවහල් වන කරුණු අවධාරණය කරමින් දේශනා කළ ධම්මපද ගාථාව ලියන්න.
 ii. ඉහත ගාථාවේ අදහස ලියන්න.
 iii. "ධම්මපදය සමස්ත මානව වර්ගයාටම පරිහරණය කළ හැකි වටිනා උපදෙස් ඇතුළත් ග්‍රන්ථයක් ලෙස සැලකිය හැකිය." විමසන්න,

04. i. පරිසරය දෙයාකාර ය. එය නම් කරන්න.
 ii. බුදුරජාණන් වහන්සේ ස්වභාවික පරිසරය දම්සභා මණ්ඩප කරගත් අවස්ථා දෙකක් සහ සූත්‍ර දෙකක් සමග ලියන්න.
 iii. බුදුරජාණන් වහන්සේ පරිසර සුන්දරත්වය අගය කළ ආකාරය බුදු සිරිත ඇසුරින් ලියන්න.

05. i. සිව්වන ථෙරවාද ධර්ම සංගායනාව (පුස්තකාරූඪ සංගායනාව) පැවැත්වූ ස්ථානය හා සහභාගි වූ භික්ෂූන් ගණන ලියන්න.
 ii. එම සංගායනාව පැවැත්වීමට තුඩු දුන් හේතු තුනක් ලියන්න.
 iii. ධර්ම විනයේ අනාගත සුරක්ෂිතතාව සඳහා මෙම සංගායනාවේ ප්‍රතිඵල හේතු වූ ආකාරය පැහැදිලි කරන්න.

06. i. සතර සංග්‍රහ වස්තු වලට අයත් අංග දෙකක් නම් කරන්න.
 ii. ඉන් එකක් විස්තර කරන්න.
 iii. ධාර්මික රාජ්‍ය පාලනයක් සඳහා බෞද්ධ දේශපාලන මූලධර්ම ඉවහල් වන ආකාරය විස්තර කරන්න.

07. පහත මාතෘකා ඇසුරින් දෙකකට කෙටි සටහන් ලියන්න.
 i. දුටුගැමුණු රජු  ii. විපස්සනා භාවනාව  iii. සඳකඩ පහණ  iv. සද්ධර්මරත්නාවලිය



සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

බුද්ධ ධර්මය - 10 ශ්‍රේණිය
I පත්‍රය - පිළිතුරු

| | | | |
|---|---|---|---|
| 1 - 3 | 11 - 2 | 21 - 3 | 31 - 2 |
| 2 - 1 | 12 - 4 | 22 - 2 | 32 - 1 |
| 3 - 4 | 13 - 1 | 23 - 4 | 33 - 3 |
| 4 - 2 | 14 - 3 | 24 - 1 | 34 - 2 |
| 5 - 3 | 15 - 4 | 25 - 3 | 35 - 4 |
| 6 - 1 | 16 - 2 | 26 - 2 | 36 - 1 |
| 7 - 3 | 17 - 3 | 27 - 4 | 37 - 4 |
| 8 - 2 | 18 - 1 | 28 - 1 | 38 - 1 |
| 9 - 4 | 19 - 4 | 29 - 4 | 39 - 3 |
| 10 - 1 | 20 - 2 | 30 - 2 | 40 - 3 |

II කොටස

(01) i. සර්වමිත්‍ර පඬිවරයා
ii. කායික රෝග, මානසික රෝග
iii. සන්දිට්ඨික ගුණයයි.
iv. "හේතුවෙන් උපදින යම් ධර්ම කෙනෙක් වෙත් ද, ඒ ධර්මයන්ගෙන් හේතුව තථාගතයන් වහන්සේ වදාළ සේක."
v. රාග, දෝස, මෝහ සද්ධා, බුද්ධි, විතක්ක - චරිත
vi. වෛර කරන්නවුන් අතර අවෛරීව සුවසේ වාස කරමු.
vii. බුදු, පසේ බුදු, මහරහත්
viii. ත්‍රිවිධ රත්නය පිළිබඳ කරුණු දැන ඇති කරගන්නා පැහැදීම
ix. ඡන්ද, දෝස, භය, මෝහ
x. බුත්සරණ, විද්‍යාචක්‍රවර්ති (විදු සක්විති) පඬිවරයා (ලකුණු 2x10 = 20)

(02) i. "මහණෙනි මම චේතනාව කර්මය යැයි කියමි"
ii. ගරුක කර්ම, ආසන්න කර්ම, ආචිණ්ණ කර්ම, කටත්තා කර්ම
iii. යහපත් චේතනා කුසල කර්ම ලෙසත්, අයහපත් චේතනා අකුසල කර්ම ලෙසත් සැළකේ. යම් කුමන හෝ ක්‍රියාවක් කළ විට එයින් දුක් හෝ සැප විපාක ගෙන දේ. ඒ අනුව තම තමා විසින් කළ යුතු හෝ නොකළ යුතු ක්‍රියාවන් පිළිබඳ නිවැරදි අවබෝධයෙන් යුතුව කළ විට ලැබෙන ප්‍රතිඵලයන් පිළිබඳ ද , යහපත් ජීවිතයක් ගොඩනගා ගැනීමට නම් පස් පවින් වෙන් වී, දස අකුසලයෙන් වෙන් වී දස පුණ්‍ය ක්‍රියා ආදියෙහි නිරත වීමෙන් කුසල ශක්තීන් වර්ධනය කරගත හැක.
(ලකුණු 2+3+5 = 10)

(03) i. "උට්ඨානවතො සතිමතො - සුචිකම්මස්ස නිසම්මකාරිනො
සඤ්ඤතස්ස ච ධම්මජීවිනො - අප්පමත්තස්ස යසෝභි වඩ්ඪති"
ii. උත්සහයෙන් ද, නිවැරදි සිහියෙන් ද, යුතු නිදොස් දේ විමසා බලා කරන තැන්පත්, දැහැමි දිවි පැවතුම් ඇති නොපමා වූ පුද්ගලයාගේ කීර්තිය මනාව වැඩේ.
iii. බුද්ධ දේශනාවට අන්තර්ගත වූ, පසුකාලීනව ධම්ම පදට්ඨකථාව වශයෙන්, සමන්විත වූ ධම්මපදය සමස්ත මානව වර්ගයාටම ආදර්ශ සහ පුද්ගල චර්යා සකසන මනා උපදේශාත්මක ග්‍රන්ථයකි. ධම්මපදයෙහි ඇති ගාථා සියල්ලම එලෙස ධර්මය පහදා දීම සඳහා උපදේශ සපයමින් දේශනා කර තිබීම සියලු දෙනාම තේරුම් ගැනීමට බොහෝ සෙයින් ඉවහල් වේ.
(ධම්මපදය පිළිබඳ කුමන හෝ කරුණු දක්වමින් පිළිතුරු ගොඩනගා ඇත්නම් මුළු ලකුණු දෙන්න) (ලකුණු 2+3+5 = 10)

(04) i. ජීව පරිසරය, අජීවී පරිසරය
ii. ඉසිපතන මිගදාය- ධම්මචක්කපවත්වන - පළමු දම් දෙසුම
ගිජ්ජකූට පර්වත සූකරකත ලෙස - වේදනා පරිග්ගහ සූත්‍රය
ඉච්ඡානංගල වනය - අම්බට්ඨ සූත්‍රය
කලන්දක නිවාප - මොග්ගල්ලාන සූත්‍රය
චම්පා නුවර ගග්ගරා පොකුණ - සෝණදන්ඩ සූත්‍රය
මහී ගංගා තීරය - ධනිය ගෝපාල සූත්‍රය
අචිරවතී නදිය - තේවිජ්ජ සූත්‍රය
විශාලා මහනුවර වන පියස - මහා සීහනාද සූත්‍රය
ඇට්ටේරියා වනය - සිංසපා සූත්‍රය
ජීවක අඹ වනය - සාමඤ්ඤඵල සූත්‍රය
කෙත්යායක - කසීභාරද්වාජ් සූත්‍රය
iii. 1. අරියාපරියේසන සූත්‍රයේ දී... "මහණෙනි මම කුසලය කුමක්දැයි සොයාන සුළු වූයෙමි ..." එහි වූ සිත්කළු භූමි භාගය දැක සිත පහදවන වන ලැහැබ ද සුදු වැලිතලා මැදින් තිවී සැනසිල්ලේ ගලාබස්නා මනා තොටුපොළින් ද යුත් මනරම් නේරංජනා නදිය
2. බුදුබව ලබාගත් පසු දෙවන සතියේ දී අනිමිස ලෝචන පූජාව අවස්ථාව
3. සත්සතියේ හයවැනි සතිය මුචලින් ද විල අසල අවස්ථාව
4. ආනන්දයෙනි මේ රජගහ නුවර සිත් අලවන සුළුය
5. චෞර පර්වතය සිත් අලවන සුළුය
6. විශාලා මහනුවර පිහිටි ස්ථාන වර්ණනාව (උදේන ගෝතමක, සත්තම්භක , සාරන්දද)
(මේ ආදී බුදු සිරිතට අදාළව බුද්ධත්වය, ධර්ම දේශනා, ස්ථාන, පරිනිර්වාන ස්ථාන ආදිය පිළිබඳව පිළිතුරු ලියා ඇත්නම් ලකුණු දෙන්න)
(ලකුණු 2+3+5 = 10)

(05) i. පැවැත්වූ ස්ථානය - මාතලේ අලුවිහාරය
සහභාගී වූ පිරිස - භික්ෂූන් වහන්සේ 500 ක්

ii. * බුදු දහමට වෙනත් දුර්මතවලින් හානිවීම වළක්වාලීම
* බැමිණිතියා නියං සාගත තත්ත්වය
* මහා විහාරයීය භික්ෂූන්ට රාජානුග්‍රහය නොලැබීම.
* දකුණු ඉන්දීය ආක්‍රමණිකයින්ගේ රාජ්‍යත්වය බලපෑම් එල්ලවීම.
* භික්ෂූන්ගේ භේද භින්නතා (ග්‍රන්ථ ධූරය, විදර්ශනා ධූරය)
* භික්ෂූන්ගේ ශාසනික පිළිවෙත් පිරිහී තිබීම.

iii. ථේරවාදී සංගායනා වලින් පසු බුදු දහම පැවත ආයේ මුඛ පරම්පරාවෙනි. මෙම සංගායනාවෙන් සිදු වූ විශේෂම මහඟු ප්‍රතිඵලය වුයේ ත්‍රිපිටක ධර්මය ග්‍රන්ථාරූඪ වීමයි. මේ නිසා ධර්මය විකෘතිතා වලින් සුරක්ෂිත කර ගැනීමට ඉඩ ප්‍රස්ථාව ලැබුණි. එසේම භික්ෂූන් වහන්සේ නිකාය වශයෙන් බෙදී මතවාද පැතිරීම නැති වී යෑම, බුදු දහම දීර්ඝකාලීනව සුරක්ෂිත කර ගැනීම , ජාත්‍යන්තරව නැවත ධර්මය ඒ ඒ භාෂාවලට පරිවර්තනය කරගැනීමට ඉඩ ලැබීම, ධර්ම විනය නැවත ආරක්ෂා කරගැනීම .. ආදී කරුණු රාශියක් මෙම සංගායනාව නිසා සුරක්ෂි කර ගත හැකි විය. (ලකුණු 2+3+5 = 10)

(06) i. දානය, ප්‍රිය වචනය, අර්ථචර්යාව, සමානාත්මතාව

ii. දානය :- දානය යනු පරිත්‍යාගය යි. පිරිසිදු සිතින් යුතුව ජාති, ආගම්, කුල භේද වලින් තොරව කරන පරිත්‍යාග දානයයි. පුද්ගල චරිත සංවර්ධන කරගැනීම අන්‍යොන්‍ය විශ්වාසය ගොඩනගා ගැනීම, රටක ආර්ථික දියුණුව පිණිස රාජ්‍ය නායකත්වය විසින් සිදුකරන, සිදුකළ යුතු යටිතල පහසුකම් ආදිය මෙම දානය යන්නට අයත් වේ.

ප්‍රියවචනය :- යහපත් වචනයයි. බොරුවෙන් තොරවීම සුවිශේෂීය. සත්‍ය වචන ප්‍රකාශ කිරීම. නායකත්වය විසින් ජනයා බොරුවෙන් මුලා නොකොට මිත්‍රශීලීව කටයුතු කිරීමයි.

අර්ථචර්යාව :- අනුන්ගේ යහපත හා අනුන්ගේ දියුණුව පිණිස කටයුතු කිරීමයි. සැබෑ පාලකයෙකු ජනතා සේවය හැර වෙනත් අරමුණක් නොතිබිය යුතුය. සිව්බඹ විහරණයෙන් යුතුව පාලකයා ජනතාව සතුටු කළ යුතුය.

සමානාත්මතාවය :- රටේ සියලු ජනයා සම සිතින් යුක්තව කටයුතු කිරීම සමානාත්මතාවය යි. සමාජයේ සියල්ලන්ගේ යහපත හා අභිවෘද්ධිය වෙනුවෙන් සමානව සැළකීම මෙයින් අදහස් කෙරේ.

iii. බුදුදහම පුද්ගලයාගේ හා සමාජයේ සදාචාර සංවර්ධනය සඳහා ද , ආධ්‍යාත්මික දියුණුව වැඩි දියුණු කර ගැනීමට ද මෙලොව - පරලොව යහපැවැත්මට ද මග පෙන්වා දෙන දහමකි. දැහැමි සමාජයක් ගොඩ නැගීමට, යහපත් පුද්ගල සංවර්ධනයක් ඇතිකර ගැනීමට මනා දේශපාලන පරිසරයක් තිබිය යුතු වෙයි. ඒ සඳහා අදාළ දේශපාලනමය රාජ්‍ය පරිපාලන ප්‍රතිපත්ති රැසක් බුදු දහමේ දක්වේ. එම කරුණු බොහෝ සූත්‍ර දේශනාවල ඉගැන්වේ. මහා පරිනිබ්බාණ, චක්කවත්ති සීහනාද සූත්‍ර ඒ අතර වැදගත් වේ. ඒවායේ පෙන්වා දෙන දස සක්විතිවත්, සප්ත අපරිහානීය ධර්ම, සතර සංග්‍රහ වස්තු ආදිය මගින් එම රාජ්‍ය පාලනවිධි උගන්වනු ලබයි. (ලකුණු 2+3+5 = 10)

(07) i. දුටුගැමුණු මහ රජතුමා :-
මාගම රාජධානිය කරගෙන රාජ්‍යත්වයට පත් දුටුගැමුණු මහරජතුමා, ශ්‍රී ලංකාද්වීපයම එක්සේසත් කළ ප්‍රබල රාජ්‍ය පාලකයෙකි. අනුරාධපුර එළාර රජුගේ ආක්‍රමණය නිසා වර්ෂ ගණනාවක් තිස්සේ වියැකී යමින් තිබූ බෞද්ධ උරුමය යළි ආරක්ෂිත කොටගැනීම සඳහා සේනා සංවිධානය කර, මහසඟරුවනේ ආශිර්වාදය ලබාගෙන යුද්ධයට සැරසී ජයග්‍රහණය ලබා ගන්නා ලදි. "මාගේ මේ ව්‍යායාමය බුදු සසුනේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙකත් රජසැප පිණිස නොවේ." යන ප්‍රතිඥාව දරාගෙන ක්‍රියාකොට ජයග්‍රහණයෙන් අනතුරුව මහාථූපය, මිරිසවැටිය, ලෝවාමහාපාය යන සුවිශේෂී බෞද්ධ විහාරාරාම රැසක් ද කෘෂිකර්මාන්තය වෙනුවෙන් ද කටයුතු කළ ශ්‍රේෂ්ඨ රජ කෙනෙකි.

ii. විපස්සනා භාවනාව :-
විපස්සනා යන්නෙන් අදහස් වන්නේ යථාර්ථය මනා නුවණින් විශේෂයෙන් දැකීමයි. එනම් ඇත්ත ඇති සැටියෙන් දැකීමයි. "විසෙසේන පස්සතීති විපස්සනා" විශේෂයෙන් බලයි යන්නයි. මෙය විශේෂ භාවනාවකි. මෙම භාවනාව තුළින් ඇත්ත ඇති සැටියෙන් දකින නුවණ බුදු දහමේ දී හඳුන්වා ඇත්තේ පඤ්ඤා භාවනාව වශයෙනි. එය ත්‍රිලක්ෂණය වශයෙන් ද හඳුන්වනු ලබයි. සසර දුකින් මුදාලන , ප්‍රඥාව ලබාදෙන භාවනාව ලෙස ද හැඳින්වේ.

iii. සඳකඩ පහණ :-
බෞද්ධ සිද්ධස්ථාන වලට යන දොරටු අභියස මෙය බොහෝ විට නිර්මාණය කර ඇත. මුලදී පාපිස්නක් ලෙස සැකසුණු මෙය පසුකාලීනව විචිත්‍රවත් කැටයම් වලින් සමන්විත සඳකඩ පහණ සුවිශේෂී නිර්මාණයකි. පලාපෙති සාරවංශික සතුන්, සංකීර්ණ ලියවැල, හංස පේළිය, සරල ලියවැල, නෙළුම් මල මෙහි කැටයම් කර ඇත. මහාචාර්ය සෙනරත් පරණවිතාන ශූරීන් පවසා ඇත්තේ සඳකඩ පහණ මගින් සත්ත්වයාගේ භව චක්‍රය නිර්මාණය කරන බවයි. ඉතා අනර්ඝ සඳකඩ පහණ අනුරාධපුර බිසෝ මාළිගය අභියස (පංචාවාස ගොඩනැගිල්ල) දක්නට ලැබෙන අතර, පසුකාලීනව නිර්මාණය වූ සඳකඩ පහණවල බොහෝ වෙනස්කම් දක්නට ඇත.

iv. සද්ධර්මරත්නාවලිය
දඹදෙණි සාහිත්‍ය යුගයේ දී ලියවුණු මෙම ග්‍රන්ථයේ කතුවරයා ධර්මසේන හිමියන් ය. ධම්මපදයට ලියූ පාලි ධම්මපදට්ඨ කථාව ඇසුරින් මෙම ග්‍රන්ථය සම්පාදනය කර ඇත. උපමා උපමේය භාවිතා කොට ගැමි ජීවිතයේ හදවත්වලට කතාකරන මෙම ග්‍රන්ථය තුළින් බුදුරදුන්ගේ දහම් පණිවිඩය සරලව ජනයාට ලබාදෙන අගනා ග්‍රන්ථයකි. "මිණිකැට අමුණන ලද මාලය" නැමැති අපර නාමයකින් ද මෙය හඳුන්වනු ලබයි.



සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න



පොත් 3 ක් ගත්තොත්,
1 ක් නොමිලේ.
25% දක්වා වට්ටම් හිමිකරගන්න.
හොඳම පොත් අඩුම මිලට අපෙන් විතරමයි...
දැන්ම lol.lk වෙත පිවිසෙන්න
Atlas
Richard
RATHNA EXERCISE BOOKS
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
LOL.LK
LOL STORE (PVT) LTD
COD
CASH ON DELIVERY
037 20 60 110
071 77 74 440